# උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ මහාමාර්ග අංශය යටතේ ක්‍රියාත්මක පහත සඳහන් විදේශාධාර ව්‍යාපෘතීන්හි (ඇමරිකන් ඩොලර් මිලියන 250 ට වැඩි) අභ්‍යන්තර විගණක තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම ව්‍යාපෘති මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2016 හි සඳහන් විධිවිධානයන්ට යටත්ව ව්‍යාපෘති කළමනාකරණ ඒකක (PMU) වශයෙන් ස්ථාපිත කොට ඇත.

**පුරප්පාඩු පවතින ව්‍යාපෘති**

1. කණුමතින් දිවෙන අධිවේගී මාර්ග ව්‍යාපෘතිය – පුරප්පාඩු 01
   (නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා)
2. රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය – පුරප්පාඩු 01

**තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් පහත දක්වා ඇත**

1. **අභ්‍යන්තර විගණක** (**PS** 4)

   අවම සුදුසුකම් සහ පළපුරුද්ද : (පහත 1 හෝ 2)

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ගණකාධිකරණ / විගණන විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලබාගත් මූලික උපාධියක්

   හෝ

   ගණකාධිකරණ / විගණන විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වූ උපාධියකට සමාන බවට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්

   හෝ

   ගණකාධිකරණ ක්ෂේත්‍රය හා සම්බන්ධ පිළිගත් වෘත්තීයමය ආයතනයක අන්තර් මාධ්‍ය විභාගය සමත් වී තිබීම

   සමග

   ගණකාධිකරණ / විගණන විෂය ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් වසර 09 ක පශ්චාත් සුදුසුකම් සහිත පළපුරුද්ද

2. ගණකාධිකරණ/විගණන විෂය ක්ෂේත්‍රයට අදාළ රජයේ දීප ව්‍යාප්ත සේවාවන් වල හෝ සමාන සේවා තත්ත්වයේ III/II හෝ ඊට ඉහළ පන්තීන්ට අයත් නිලධරයෙකු වීම

   සමග

   III/II වන පන්තියේ තනතුරක අවම වශයෙන් වසර 11 ක පළපුරුද්ද ලබා තිබීම

**කොන්දේසි**

1. වයස් සීමාව :
   අවුරුදු 65 ට අඩු
2. වැටුප
   මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2016 මත පදනම්ව ගෙවනු ලැබේ.
3. සේවා කොන්දේසි
   මූලිකව වසර 1 ක කාලපරිච්ඡේදයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත පත්කරනු ඇත. කාර්ය සාධනය මත පදනම්ව සේවය දීර්ඝ කිරීම සලකා බැලිය හැකිවනු ඇත.
4. වෙනත් ප්‍රතිලාභ
   සේවක අර්ථ සාධක අරමුදල සඳහා සේවකයා විසින් දායක කරනු ලබන 8% සඳහා ව්‍යාපෘතිය විසින් 12% ක් දායක කරනු ඇති අතර, සේවක භාරකාර අරමුදල සඳහා 3% ක අතිරේක දායකත්වයක් සපයනු ඇත.

සුදුසුකම්, පළපුරුද්ද සහ වෙනත් අදාළ තොරතුරු පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරමින් අයදුම්කරු පිළිබඳව තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් ද සහිතව සකස් කරන ලද අයදුම්පත් 2018.04.06 දිනට පෙර ලේකම්, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය **"මග නැගුම මහමැඳුර"** අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම්කවරයේ ඉහළ වම් කෙළවරේ **"අභ්‍යන්තර විගණක තනතුර සඳහා අයදුම් කිරීම (ඇමරිකන් ඩොලර් මිලියන 250 ට වැඩි)"** යන්න සඳහන් කළ යුතුය. දැනටමත් රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, මණ්ඩල සහ අධිකාරීන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

**ලේකම්,**
**උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය**

# උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ මහාමාර්ග අංශය යටතේ ක්‍රියාත්මක පහත සඳහන් විදේශාධාර ව්‍යාපෘතීන්හි (ඇමරිකන් ඩොලර් මිලියන 100-250 අතර) අභ්‍යන්තර විගණක තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම ව්‍යාපෘති මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2016 හි සඳහන් විධිවිධානයන්ට යටත්ව ව්‍යාපෘති කළමනාකරණ ඒකක (PMU) වශයෙන් ස්ථාපිත කොට ඇත.

**පුරප්පාඩු පවතින ව්‍යාපෘති**

1. වරාය පිවිසුම් ගුවන් මාර්ග ව්‍යාපෘතිය - පුරප්පාඩු 01
2. විශේෂ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - පුරප්පාඩු 01
3. නායයෑම් ආපදා කළමනාකරණ ඒකකය - පුරප්පාඩු 01
4. බදුල්ල චෙන්කලාඩි මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - පුරප්පාඩු 01
5. විවිධ විදේශ ආධාර ව්‍යාපෘතිය - පුරප්පාඩු 01
6. ප්‍රවාහන සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය - පුරප්පාඩු 01
7. ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩ සටහන - අදියර II - පුරප්පාඩු 01

**තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් පහත දක්වා ඇත**

1. **අභ්‍යන්තර විගණක (PS 4)**

අවම සුදුසුකම් සහ පළපුරුද්ද : (පහත 1 හෝ 2)

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ගණකාධිකරණ / විගණන විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලබාගත් මූලික උපාධියක්

හෝ

ගණකාධිකරණ / විගණන විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වූ උපාධියකට සමාන බවට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්

හෝ

ගණකාධිකරණ ක්ෂේත්‍රය හා සම්බන්ධ පිළිගත් වෘත්තීයමය ආයතනයක අන්තර් මාධ්‍ය විභාගය සමත් වී තිබීම

සමග

ගණකාධිකරණ / විගණන විෂය ක්ෂේත්‍රයට අදාලව අවම වශයෙන් වසර 08 ක පශ්චාත් සුදුසුකම් සහිත පළපුරුද්ද

2. ගණකාධිකරණ/විගණන විෂය ක්ෂේත්‍රයට අදාළ රජයේ දීප ව්‍යාප්ත සේවාවන් වල හෝ සමාන සේවා තත්ත්වයේ III/II හෝ ඊට ඉහළ පන්තීන්ට අයත් නිලධාරියෙකු වීම

සමග

III/II වන පන්තියේ තනතුරක අවම වශයෙන් වසර 09 ක පළපුරුද්ද ලබා තිබීම

**කොන්දේසි**

1. වයස් සීමාව : අවුරුදු 65 ට අඩු
2. වැටුප

මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2016 මත පදනම්ව ගෙවනු ලැබේ.

3. සේවා කොන්දේසි

මූලිකව වසර 1 ක කාලපරිච්ඡේදයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත පත්කරනු ඇත. කාර්ය සාධනය මත පදනම්ව සේවය දීර්ඝ කිරීම සලකා බැලිය හැකිවනු ඇත.

4. වෙනත් ප්‍රතිලාභ

සේවක අර්ථ සාධක අරමුදල සඳහා සේවකයා විසින් දයක කරනු ලබන 8% සඳහා ව්‍යාපෘතිය විසින් 12% ක් දයක කරනු ඇති අතර, සේවක භාරකාර අරමුදල සඳහා 3% ක අතිරේක දායකත්වයක් සපයනු ඇත.

සුදුසුකම්, පළපුරුද්ද සහ වෙනත් අදාළ තොරතුරු පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරමින් අයදුම්කරු පිළිබඳව තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් ද සහිතව සකස් කරන ලද අයදුම්පත් 2018.04.06 දිනට පෙර ලේකම්, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය "මග නැගුම මහමැදුර" අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම්කවරයේ ඉහළ වම් කෙළවරේ "**අභ්‍යන්තර විගණක තනතුර සඳහා අයදුම් කිරීම (ඇමරිකන් ඩොලර් මිලියන 100-250 අතර)**" යන්න සඳහන් කළ යුතුය. දැනටමත් රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, මණ්ඩල සහ අධිකාරීන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාල ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.

**ලේකම්,**

**උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය**